හෙරොයින් මත්ද්‍රව්‍ය ජාවාරමකට මැදි වූ බවට වාර්තා වන බොරැල්ල ප්‍රදේශයේ සැකකාරියකට සහ සැකකරුවෙකුට අයත් බවට පැවසෙන දේපළ, මුදල් විශුද්ධිකරණ පනත යටතේ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් අද දෙරණ ප්‍රධාන පුවත් (මාර්තු 09, 2023) සහ අරුණ පුවත්පතේ (මාර්තු 10, 2023) සිරස්තල තුළ සඳහන් වූ ආකාරය මෙසේ දැක්විය හැක.

"හෙරොයින් ජාවාරමකට මැදි වූ සුරූපී තරුණියක් මුදල් විශුද්ධිකරණය යටතේ අත්අඩංගුවට" - අද දෙරණ

"කුඩු ජෝඩුවගේ කෝටි දෙකක ඉඩම රාජසන්තකයි" - අරුණ

ඔබ සිතන ආකාරයට,

1) මෙම සැකකාරියගේ "සුරූපී" බාහිර ස්වරූපය මෙම පුවතට අදාළ වන්නේ කෙසේද? මෙම පුවතේ සිරස්තලය එසේ සඳහන් කරන්නේ, පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබා දීමට ද?

2) "කුඩු ජෝඩුව" වැනි යෙදුම් ඔස්සේ, මත්ද්‍රව්‍ය වලට සම්බන්ධ වූ බවට පැවසෙන්නවුන් පොදුවේ සෘණාත්මකව ලේබල් කිරීමක් සිදු නොවන්නේ ද? එවැනි යෙදුම් පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

